**වීඩියෝ කැමරා ශිල්පී තනතුර හා නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර සඳහා :**

රජය හෝ රජය පිළිගත් ආයතනයක ඡායාරූප ශිල්පියෙකු වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය)

02. *බඳවා ගැනීමේ ක්‍රමය .-*

**ප්‍රවෘත්ති නිලධාරි තනතුර**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත වැඩිම ලකුණු ලබාගන්නා අය තෝරාගනු ලැබේ.

**වීඩියෝ කැමරා ශිල්පී තනතුර හා නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත හා ප්‍රායෝගික පරීක්ෂණයක් තුලින් වැඩිම ලකුණු ලබාගන්නා අය තෝරාගනු ලැබේ.

03. *සේවා කොන්දේසි :*

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායකවිය යුතුය. තනතුරට පත්වී වසර 05 ක් ඇතුළත 2007.05.28 දිනැති අංක 7/2007 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය. මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වනු ඇත. පත්වීම ලැබීමෙන් අනතුරුව වර්ෂ 03 ක කාලයක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.

04. *වැටුප් බණ්ඩය හා වැටුප් පරිමාණය :*

**ප්‍රවෘත්ති නිලධාරි තනතුර**

රා.ප.ච. 6/2006 (iv) අනුව (එම්එන් 4 -2006 -ඒ)
රු. 15,215 - 10 x 215 -4 x 240 - 7 x 320 - 15 x 360 - රු. 25,965.
(III, II හා I ශ්‍රේණි අදාළ වේ).

*සටහන.* - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි II, I ශ්‍රේණි සඳහා උසස්වීම් පරිපාටිය සකස් කර උසස්වීම් ලබාදෙන තෙක් III ශ්‍රේණියට අදාළ රු. 15,215 - 10 x 215 - රු. 17,365 වැටුප් පරිමාණය මත බඳවාගනු ලැබේ.

**වීඩියෝ කැමරා ශිල්පී තනතුර හා නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර**

රා. ප. ච. 6/2006 (iv) අනුව (එම් ටී1- 2006 ඒ)
රු. 14,425 - 10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - රු. 23,665
(III, II හා I ශ්‍රේණි අදාළ වේ).

*සටහන.* - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි II, I ශ්‍රේණි සඳහා උසස්වීම් පරිපාටිය සකස් කර උසස්වීම් ලබාදෙන තෙක් III ශ්‍රේණියට අදාළ රු. 14,425- 10 x 145 - රු. 15,875 වැටුප් පරිමාණය මත බඳවාගනු ලැබේ.

එම්. එම්. සී. ප්‍රදීනාන්දු,
ලේකම්,
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 06 වැනි දින.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

ආදර්ශ අයදුම් පත්‍රය

**විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ**

.................... තනතුර සඳහා අයදුම්පත්‍රය

1. (අ) මුලකුරු සමග නම :————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
2. ලිපිනය :————.
3. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
4. උපන් දිනය :————.
5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවු :——.මාස :——. දින :——.
6. ජාතික හැඳුනුම්පත් අංකය :————.
7. විවාහක/අවිවාහක බව :————.
8. අධ්‍යාපන සුදුසුකම් :————.
9. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :————.

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

***දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය***
(රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ.................................................................... තනතුර දරන.............................................................. මහතා/මිය/මෙනෙවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම අයදුම්පතෙහි ඔහු/ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ
නිල මුද්‍රාව.

දිනය :————.

11-436

*(සැලකිය යුතුයි.-* (i) 4.15.1 යටතේ සුදුසුකම් සම්පූර්ණ කර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2006 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ විෂයයන් තුනකින් එකවර සමත් වීම.

*හා*

සිංහල/දෙමළ භාෂාව, ගණිතයට සාමාර්ථය ද, චිත්‍ර කර්මය සම්මාන සාමාර්ථයක් ද ඇතුළු හර විෂයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් වූ ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

4.16 **පාඨමාලා අංකය 16 - නැටුම් (පෙරදිග)**

4.16.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී නැටුම් විෂය ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම

*හා*

4.16.2 සිංහල භාෂාව, ගණිතය හා නැටුම් ඇතුළු හර විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

4.16.3 2007 වසරේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී නැටුම් විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.17 **පාඨමාලා අංකය 17 - නැටුම් (භරත)**

4.17.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී භරත නැටුම් විෂය ඇතුළු විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට භරත නැටුම් ඇතුළු විෂයය දෙකකින්) සමත් වීම

4.17.2 දෙමළ භාෂාව, ගණිතය හා භරත නැටුම් ඇතුළු හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

4.17.3 2007 වසරේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය අනුව අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

*(සැලකිය යුතුයි.-* (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී භරත නැටුම් විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.)

4.18 **පාඨමාලා අංකය 18 - සංගීතය (පෙරදිග)**

4.18.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සංගීත විෂය ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම.

*හා*

4.18.2 සිංහල භාෂාව, ගණිතය හා සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

4.18.3 2007 වසරේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සංගීතය විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.19 **පාඨමාලා අංකය 19 - සංගීතය (කර්ණාට)**

4.19.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් දෙකකින්) සමත් වීම;

*හා*

4.19.2 දෙමළ භාෂාව, ගණිතය හා කර්නාට සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම;

4.19.3 2007 වසරේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී සංගීතය (කර්නාට) විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

*(සැලකිය යුතුයි.-* (i) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2007 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.)

